සැ. යු. -මෙහි දෙමළ අනුවාදනය වෙනම පළ වේ. මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2007 වර්ෂයේ අප්‍රේල් - ජූනි කාර්තුවට අදාලව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,665 - 2010 ජූලි මස 30 වැනි සිකුරාදා - 2010.07.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1396 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1409 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1236 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 අගෝස්තු මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජූලි මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08.,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## කළුතර ප්‍රාදේශීය සභාව

### තනතුරු පුරප්පාඩු

කළුතර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුවී පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුස්සන් තෝරා පත්කර ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :-

| අනු අංකය | තනතුරු සංඛ්‍යාව | තනතුරු නාමය | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | 01 | ආදායම් පරිපාලක II ශ්‍රේණිය | රු.12,940-120x10-140x11-210x10-290x10 රු.20,660 4 වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාරයකදී අංක ගණිතය/ශුද්ධ ගණිතය/ වාණිජ්‍ය අංක ගණිතය/ ගණිතය හා සිංහල/දෙමළ භාෂාව ඇතුලු විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබීම හා බස්නාහිර පළාත තුළ පළාත් පාලන ආයතනයක වසර 05ක සේවා කාලයක් සහිත ස්ථිර තනතුරක් දරන්නකු වීම ;<br>හෝ<br>ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙළ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ශුද්ධ ගණිතය /වානිජ්‍ය අංක ගණිතය/ ගණිතය සහ සිංහල/ දෙමළ භාෂාව ඇතුලු විෂයයන් 05කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම. |
| 02. | 01 | කාර්යාල කාර්ය සහායක | මාසිකව රු.11,730-10x120-10x130-10x145-12x160 - රු.17,600 කාර්යක්ෂමතා කඩඉම හත්වන වැටුප් පියවරට (රු.13,840) එළඹීමට පෙර, මෙම වැටුප් පරිමාණයේ 12 වන පියවර(රු.13,060) ආරම්භක පියවර ලෙස ගත යුතුය. | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී එක් වරකදී කවර හෝ විෂයයන් 06 ක් සමත් විය යුතුය. |
| 03. | 01 | කම්පන ක්‍රියාකරු | මාසිකව රු.12,210-10x130-10x145-10x160 -12x170 - රු.18,600 කාර්යක්ෂමතා කඩඉම හතරවන (රු.12,600) වාර්ෂික වැටුප් පියවරට එළඹීමට පෙර. | ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී , හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් දෙකක් සමත් වී තිබීම ;<br>සහ<br>මෙම තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.) |
| 04. | 01 | පුස්තකාල කම්කරු | මාසිකව රු.11,730-10x120-10x130-10x145-12x160 - රු.17,600 කාර්යක්ෂමතා කඩඉම හතරවන වැටුප් පියවරට(රු.12,090) එළඹීමට පෙර. | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය. |
| 05. | 01 | සෞඛ්‍ය කම්කරු | මාසිකව රු.11,730-10x120-10x130-10x145-12x160 - රු.17,600 කාර්යක්ෂමතා කඩඉම හතරවන වැටුප් පියවරට (රු.12,090) එළඹීමට පෙර | අධ්‍යාපන සුදුසුකම් සළකා බලනු නොලැබේ. |

*බඳවා ගැනීමේ කොන්දේසි :*

01. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
02. අයදුම්කරුවන් බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
04. අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.
05. කළුතර ප්‍රාදේශීය සභාවේ දැනට තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් (වැඩ ඒකක) සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.
06. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
(iii) මෙම බඳවාගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ කළුතර ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටී.

*අයදුම් කළ යුතු ආකාරය .-* මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12' x 8" ප්‍රමාණයේ අයදුම්පත් සකස් කර ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම්පස ලියා 2010.08.13 වැනි දිනට පෙර "ලේකම්, කළුතර ප්‍රාදේශීය සභාව - ගාලු පාර, වස්කඩුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය :-

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතික ;
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය;
4. මෑතකදී ලබාගත් ග්‍රාමනිලධාරී සහතිකය;
5. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්.

ගීතානි ඩී. ලොකුවැල්ල,
ලේකම්,
කළුතර ප්‍රාදේශීය සභාව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***කළුතර ප්‍රාදේශීය සභාව***

…………………… *තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. *(අ)* මුලකුරු සමඟ නම :————.
*(ආ)* සම්පූර්ණ නම :————.
02. ලිපිනය :————.
03. උපන් දිනය : අවුරුද්ද :————, මාසය :————, දිනය :————.
04. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
05. විවාහක/අවිවාහක බව :————.
06. ජාතිය :————.
07. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද, ලියාපදිංචි වීමෙන් ද යන වග :————.
08. අධ්‍යාපන සුදුසුකම් :————.
09. ඔබ දැනටමත් මෙම ආදේශක සේවයේ යෙදෙන්නේනම් සේවා කාලය සහ විස්තර :————.
(ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම ද යන වග)

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත් ඒවා බව සහතික කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බවට ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

07-957

## අක්මීමන ප්‍රාදේශීය සභාව

අක්මීමන ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා නියමිත සුදුසුකම් ඇති අක්මීමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :-

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප* | *අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| ආයුර්වේද ඖෂධ සංයෝජක III | 02 | රු.12,470-130 x 110-145x10 - 160x10-170x12- රු. 18,860 | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය, ශුද්ධ ගණිතය/වානිජ අංක ගණිතය/ගණිතය හා සිංහල/දෙමළ භාෂාව ඇතුලුව විෂයයන් 06කින් සාමාර්ථ තිබීම ;<br>*සහ*<br>රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ පිළිගත් රජයේ ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක කිසියම් තනතුරක වසරකට නොඅඩු කාලයක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |

*02. අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය (දැනට සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ).
(ii) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(iii) අයදුම්කරු අක්මීමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අවුරුදු 03ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුයි)
(iv) අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
(vi) අක්මීමන ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(vii) අයදුම්කරුවන් ඒ ඒ තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

*03. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුරු ස්ථිරය.
(ii) දායක විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.
(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන්නේය.
(iv) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජය හෝ පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියළු සේවකයින් බැඳී සිටිය යුතුය.

*04. බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) අවශ්‍යතාවය අනුව ලිඛිත/ව්‍යුහගත/ප්‍රායෝගික හෝ සම්මුඛ පරීක්‍ෂණයක් මගින් සුදුසු අය තෝරා ගැනේ.
(ii) අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල්පිටපත් සම්මුඛ පරීක්‍ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතිකය;
(iii) පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය;
(iv) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්;
(v) වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික තිබේ නම් එම සහතික.

05. මූලික සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

*06. අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2010..08.31 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, අක්මීමන" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර අයදුම්කරන තනතුර පැහැදිළිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල අක්මීමන ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඒ. ජී. මදරසිංහ,
ලේකම්,
අක්මීමණ ප්‍රාදේශීය සභාව.

2010 ක්වූ ජූලි මස 12 වැනි දින,
අක්මීමණ ප්‍රාදේශීය සභා කාර්යාලය,
අක්මීමන.

ආදර්ශ අයදුම්පත්‍රය

*අක්මීමණ ප්‍රාදේශීය සභාව*

*.................................. තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————.
2. තැපැල් ලිපිනය:——————————.
3. උපන් දිනය:
   වර්ෂය :——————————, මාසය:——————————, දිනය:——————————.
4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඃ
   අවුරුදු :——————————, මාස:——————————, දින:——————————.
5. විවාහක/අවිවාහක බව:——————————.
6. ජාතිය :——————————.
7. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ? එසේනම් පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන් ද ? යන වග:——————————.
8. අධ්‍යාපන සුදුසුකම් :——————————.
9. වෘත්තීය සුදුසුකම් :——————————.
10. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්:

    (i) දැනට දරන තනතුර :——————————;
    (ii) එම තනතුරට පත්වූ දිනය:——————————;
    (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/පදනම මත ද) :——————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

07-915

---

**දොම්පෙ ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දොම්පෙ ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම් පත්‍ර සම්පූර්ණ කර "ලේකම්, දොම්පෙ ප්‍රාදේශීය සභාව, කිරිඳිවැල" යන ලිපිනයට 2010.08.20 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අවම සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | ඖෂධ සංයෝජක | 01 | රු.12,470-10x130-10x145 -10x160-12x170 -රු.18,860(PL-3-2006/A) (3 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.) | *1. (අ)* ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ශුද්ධ ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය |

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | | අවම සුදුසුකම් |
|---|---|---|---|---|---|
| | | | | | සහ සිංහල/ දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම<br><br>නැතහොත් |
| | | | | 1. | ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවක දී ගණිතය සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම.<br><br>සහ<br><br>රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ පිළිගත් රජයේ ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක කිසියම් තනතුරක වසරකට නොඅඩු කාලයක සේවා පළපුරුද්ද ලබා තිබීම. |
| 02 | මුරකරු | 02 | රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600<br>(PI-1-2006/A)<br>මෙම වැටුප් පරිමාණයේ 12 වන පියවර (රු.13,060) ආරම්භක පියවර වේ. හත්වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි) | 1. | අ.පො.ස. (සා. පෙ.) විභාගයේ දී එක්වරක දී කවර හෝ විෂයයන් 06ක් සමත්වීම |
| 03 | ආදහනාගාර ක්‍රියාකරු | 01 | වැටුප් පරිමාණය පීඑල් 2-2006ඒ<br>රු.12,210-10x130-10x145-10x160 -12x170-රු.18,600<br>හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 1. | (අ) අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/ 9 වසර සමත් වී තිබීම<br><br>සහ<br>(ආ) තනතුරට අදාලව අවම වශයෙන් වසර 2ක පලපුරුද්ද ලබාතිබීම. (ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකය අවශ්‍යවේ). |
| 04 | විදුලි කම්කරු | 01 | වැටුප් පරිමාණය<br>(PL-1-2006A)<br>රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600<br>හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 1. | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/ 9 වසර සමත්වී තිබීම. |

*01. අවශ්‍ය අනෙකුත් සුදුසුකම් .-*

*(අ)* අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

*(ආ)* අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම් කිරීමට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිය සනාථ කළ යුතු ය.

*(ඇ)* බස්නාහිර පළාත් සභාවේ දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

*(ඈ)* 2010.08.20 දිනට වයස අවු. 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ සේවා නියුක්තිකයන් සඳහා වයස් සීමාව බල නොපායි.)

*(ඉ)* දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

*(ඊ)* විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

*(උ)* දැනට සේවයේ නියුක්ත අය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.
ii. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.

මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි හා මුදල් රෙගුලාසිවලට ද රජයේ දෙපාර්තමේන්තු නියෝග හා චක්‍රලේඛවලට ද බස්නාහිර පළාත් සභාව හෝ දොම්පෙ ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට තෝරාගනු ලබන සේවකයින් බැඳී සිටිය යුතු ය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලිපිවල පිටපත් ද අමුණා එවිය යුතුය :-

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතික ;
(iii). පදිංචිය සනාථ කිරීමේ සහතිකය;
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්;
එක් සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් එකක් විය යුතු ය.
(v) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික ;
(vi). වෘත්තීය/පළපුරුද්ද පිළිබඳ සහතික ;

අවශ්‍යතාවයක් මතු වුවහොත් මෙම තනතුරුවලට බඳවා ගැනීමේ අවලංගු කිරීමේ අයිතිය දොම්පෙ ප්‍රාදේශීය සභාව සතුය.

ආර්. පී. සිරිමාන්න,
ලේකම්,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2010 ක්වූ ජූලි මස 16 වැනි දින,
කිරිඳිවැල,
දොම්පෙ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

*දොම්පෙ ප්‍රාදේශීය සභාව - කිරිඳිවැල*

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ................................ තනතුර සඳහා බඳවා ගැනීම*

01. *(i)* මුලකුරු සමග නම :———.
*(ii)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :———.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :———.
03. ස්ථිර ලිපිනය :———.
04. ජාතික හැඳුනුම්පත් අංකය :———.
05. ස්ත්‍රී/පුරුෂ භාවය :———.
06. උපන් දිනය : අවුරුද්ද:———, මාසය :———, දිනය :———.
07. 2010.08.20 වැනි දිනට වයස : අවුරුදු:———, මාස :———, දින :———.
08. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද ? ලියාපදිංචියෙන් ද? : ———.
09. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :———.
10. වෘත්තීමය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුයි) :———.
11. සේවා පළපුරුද්ද :———.
12. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? :———.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ............................................................... මහතා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :———.
පදවි නාමය :———.
දෙපාර්තමේන්තුව/ආයතනය :———.
(නිල මුද්‍රාව යොදන්න).

07-1004

---

## යටිනුවර ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ යටිනුවර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. යටිනුවර ප්‍රාදේශීය සභාවේ නියුතු (ස්ථිර, අනියම්, ආදේශක) සේවකයින් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. :-

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 01. ඖෂධ සංයෝජක | 01 | PL 3 - 2006<br>රු.13,260-10x110-10x120 -10x130-12x140-රු.17,640 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය/සිංහල ඇතුළුව විෂයන් 06කින් සමත්වී තිබීම. නැතහොත් ජා.අ.පො.දු. සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවකදී ගණිතය/සිංහල ඇතුළු විෂයයන් 06කින් සමත්වී තිබීම හා තනතුරට අදාල වසර දෙකක පළපුරුද්දක් ඇති බවට පිළිගත් ආයතනයකින් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. |
| 02. පුස්තකාල සහායක | 01 | PL 1 - 2006<br>රු.11,730-10x100-10x110 10x120-12x130- රු.19,590 | රජයේ පාසැලක 8 වන ශ්‍රේණිය සමත් විය යුතුය. |
| 03. මාර්ග කම්කරු | 02 | PL 1 - 2006<br>රු.11,730-10x100-10x110-10x120-12x130- රු.19,590 | රජයේ පාසැලක 8 වන ශ්‍රේණිය සමත් විය යුතුය. |

02. *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය.
(ii) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
(iv) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
(v) අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවකු හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය.
(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා දෙපාර්තමේන්තු නියෝග වලට ද, අනුකූලව කටයුතු කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුය.

04. සුදුසුකම් සපුරාලන අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවීමෙන් පසුව සම්මුඛ පරීක්ෂණයක් සඳහා භාජනය කරනු ඇත.

05. අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ද එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතික ;
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය ;
4. මෑතක දී ලබාගත් චරිත සහතික ;
5. මෑතක දී ලබාගත් ග්‍රාමසේවා සහතිකය ;
6. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික.

තනතුර ඉල්ලීම අපේක්ෂා කරන අයදුම්කරුවන් මෙහි දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පතක් 2010.08.30 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "ලේකම්, යටිනුවර ප්‍රාදේශීය සභාව, ඇඹිල්මීගම, පිළිමතලාව" යන ලිපිනයට එවිය යුතුය. අදාළ අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුර සඳහන් කළ යුතුය.

වී. බී. වස්ගේවත්ත,
ලේකම්,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

2010 ක් වූ ජූනි මස 23 වැනි දින,
යටිනුවර ප්‍රාදේශීය සභාවේ දී ය.

යටිනුවර ප්‍රාදේශීය සභාව

*...........................................තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. මුලකුරු සමග නම :—————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.
03. ස්ථිර ලිපිනය :—————.
04. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
05. උපන් දිනය : අවුරුද්ද :————,මාසය :————,දිනය :————.
06. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ———, ලියාපදිංචි වීමෙන් ද? :—————.
07. අධ්‍යාපන සුදුසුකම් :
(i) අ.පො.ස. (සා.පෙළ) විභාගය :—————.
සමත් වර්ෂය හා විභාග අංකය :—————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

(ii) වෙනත් සුදුසුකම් :—————.

08. වෘත්තීය සුදුසුකම් :—————.

09. සේවා පළපුරුද්ද :

(i) දැනට සේවය කරන ආයතනය :—————;
(ii) දැනට දරන තනතුර :—————;
(iii) එම තනතුරට පත් වූ දිනය :—————;
(iv) පෙර සේවය කරන ස්ථානයේ දරන ලද තනතුර :—————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසිවලට අනුව මා සාවද්‍ය තොරතුරු දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන......................................මයා මෙම ආයතනයේ ...........................................................වශයෙන් සේවය කරයි. ඔහු සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු මොනම ආකාරයේ හෝ නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර/ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

—————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

ආයතනය :—————;
නම :—————;
පදවිය :—————;
දිනය :—————.

07-999

---

**හොරණ ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු සඳහා පොදු අයදුම්පත් කැඳවීම

හොරණ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සේවයේ අවශ්‍යතාව මත, නියමිත සුදුසුකම් සපුරන ලද බස්නාහිර පළාත තුල අවුරුදු 03ක ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ගෙන් හා අභ්‍යන්තර සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 01. කාර්යාල කාර්ය සහායක | 02 | 6/2006 (IV) - PL1<br>රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600<br>II පන්තිය | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් එක් වරකදී කවර හෝ විෂයයන් 6ක් සමත් ව තිබීම. |
| 02. පුස්තකාල කම්කරු | 01 | 6/2006 (IV) - PL1<br>රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600<br>III පන්තිය | 8 වන ශ්‍රේණිය 9 වසර සමත්වීම. |
| 03. ආයුර්වේද ඖෂධ සංයෝජක | 03 | 6/2006 (IV) - PL1<br>රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600<br>II පන්තිය | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනාවකදී අංක ගණිතය/ශුද්ධ ගණිතය/වානිජ අංක ගණිතය/ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම, නැතහොත් ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර පෙළ විභාගයෙන් එකම වතාවකදී ගණිතය, සිංහල, දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06ක් සාමාර්ථය ලබා තිබීම සහ රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ පිළිගත් රජයේ ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක කිසියම් තනතුරක වසරකට නොඅඩු කාලයක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |
| 04. මාර්ග කම්කරු | 04 | 6/2006 (IV) - PL1<br>රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600<br>III පන්තිය | 5 වන ශ්‍රේණිය 6 වසර සමත්වීම. |
| 05. මෝටර් ග්‍රේඩර් ක්‍රියාකරු | 01 | 6/2006 (IV) - PL3<br>රු.12,470-10x130-10x145-10x160 -12x170-රු.18,860<br>II පන්තිය | අභ්‍යන්තර අයදුම්කරුවන් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතු අතර, බාහිර අයදුම්කරුවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයයන් 02ක් සමත් විය යුතුය.<br>වෘත්තීය හා වෙනත් සුදුසුකම් යටතේ,<br>1. තාරබර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් හා මගීන් 32ට වඩා ගෙන යාමට බලපත්‍ර |

| තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|
| | | | ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනතාව පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුයි.<br>2. අවම උස අඩි 6 අඟල් 6 ක් විය යුතුය.<br>3. බඳවා ගැනීමට යෝජිත තනතුර අදාල (අංක 1 යටතේ සඳහන්) බර යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳව, රජයේ හෝ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු ප්‍රවීනතාවයක් ලබාතිබීම. (පිළිගත් ආයතනය වශයෙන් රජයේ ආයතනයක්, පළාත් රාජ්‍ය ආයතනයක්, අර්ධ රාජ්‍ය ආයතනයක්, පළාත් පාලන ආයතනයක් හෝ රජයේ ලියාපදිංචි පුද්ගලික ආයතනයක් හැඳින්වේ.)<br>4. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතුය.<br><br>තව ද වාචික හා ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කර ඉන් ලබාගන්නා කුසලතාවය මත II ශ්‍රේණියට බඳවා ගැනේ. |
| 06. පෙර පාසැල් පාලිකා | 01 | 6/2006 (IV) - MN1<br>රු.13,120-10x145-11x170-10x240 -10x320-රු.22,040<br>II පන්තිය | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනාවකදී අංක ගණිතය/ශුද්ධ ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය ඉංග්‍රීසි සහ සිංහල/දෙමළ භාෂාව ඇතුලුව විෂයයන් 06ක් සාමාර්ථය ලබා තිබීම නැතහොත් ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවකදී ගණිතය, ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාව ඇතුලුව විෂයයන් 06න් සාමාර්ථය ලබා තිබීම.<br><br>රා. ප. ච. 15/90 අනුව පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක් මගින් තීරණය වන කුසලතාවය මත පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| 07. ශාලා භාරකරු | 01 | 6/2006 (IV) - PL1<br>රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600<br>II පන්තිය | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එක් වරකදී කවර හෝ විෂයයන් 06ක් සමත්වීම. |
| 08. ආදායම් පරිපාලක | 01 | 6/2006 (IV) - MN1<br>රු.13,120-10x145-11x170-10x240 -10x320-රු.22,040<br>II පන්තිය | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය /ශුද්ධ ගණිතය/ වාණිජ අංක ගණිතය/ගණිතය සහ සිංහල /දෙමළ භාෂාව ඇතුළු විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම හා බස්නාහිර පළාත තුළ පළාත් පාලන ආයතනයක වසර 05ක සේවා කාලයක් සහිත ස්ථිර තනතුරක් දරන්නෙකු වීම ;<br><br>හෝ<br><br>ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගෙයන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ශුද්ධ ගණිතය, වාණිජ අංක ගණිතය / ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 05ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම.<br><br>රා.ප.ච. 15/90 අනුව ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීමේ පැය 1 1/2ක ප්‍රශ්න පත්‍රයක් හා සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීමේ පැය 1ක ප්‍රශ්න පත්‍රයකින් සමන්විතය. |

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 09. කර්මාන්ත පරිපාලක | 01 | 6/2006 (IV) - MN1 රු.13,120-10x145-11x170-10x240 -10x320-රු.22,040 II පන්තිය | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගෙයන් හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී, අංක ගණිතය/ගණිතය/ වාණිජ අංක ගණිතය/ශුද්ධ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුලුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම;<br><br>හෝ<br><br>ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවකදී ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06න් සාමාර්ථය ලබා තිබීම;<br><br>හෝ<br><br>පළාත් පාලන ආයතනයක අවුරුදු 10කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 8 වෙනි පන්තිය සමත්වී තිබීම.<br><br>රා.ප.ච. 15/90 අනුව ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීමේ පැය 1 1/2ක ප්‍රශ්න පත්‍රයක් හා සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීමේ පැය 1ක ප්‍රශ්න පත්‍රයකින් සමන්විතය. |

02. සියළුම තනතුරු සඳහා සුදුසුකම් ඃ-

1. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුයි. (දැනට රාජ්‍ය සහ පළාත් රාජ්‍ය සේවයේ සේවකයින්ට උපරිම වයස් සීමාව බල නොපායි)
2. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකිකයෙකු විය යුතුයි.
3. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් හා සුදුසු /යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුයි.
4. දණ්ඩනීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුයි.
5. රජයේ/පළාත් පාලන/පළාත් රාජ්‍ය සේවා හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතුයි.
6. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවකු නොවිය යුතුයි.
7. හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන් පිළිබඳ වැඩි සැලකිල්ලක් යොමු කරනු ලැබේ.
8. බස්නාහිර පළාත තුළ පදිංචි, මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්ත ස්ථිර/ආදේශ/අනියම්/කොන්ත්‍රාත්/ව්‍යාපෘති පදනම මත සේවය කරන අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ද වැඩි සැලකිල්ලක් යොමු කරනු ලැබේ.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි ඃ-

1. මෙම තනතුර ස්ථිරයි. විශ්‍රාම වැටුප් සහිතය.
2. වැන්දඹු අනත්දරු විශ්‍රාම අරමුදලට දායක මුදල් ගෙවිය යුතුයි.
3. පත්වීම අවුරුදු 03 පරිවාස කාලයකට යටත් වන්නේය.
4. ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් වරින් වර පනවනු ලබන නියෝග හා විධිවිධාන වලට හා මුදල් රෙගුලාසි වලටද යටත් විය යුතුයි.
5. තෝරාගනු ලැබූවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට අවනතභාවය ප්‍රකාශ කිරීම කළ යුතුවේ. මීට අමරතව වෛද්‍ය පරීක්ෂණ මගින් සේවය සඳහා මනා සෞඛ්‍යයකින් හෙබි අයෙකු බවට සනාථ විය යුතුයි.
6. සම්මුඛ පරීක්ෂණයක්/යෝග්‍යතා පරීක්ෂණයක් මගින් සුදුසු අය තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

04. අයදුම්පත් -

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කළ අයදුම්පත 2010.09.15 වැනි දින හෝ එදිනට ප්‍රථම ලැබෙනසේ, "ලේකම්, හොරණ ප්‍රාදේශීය සභාව, කනන්විල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහල කෙළවරේ අදාල තනතුරු නාමය සඳහන් කළ යුතුයි. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, තැපෑලේදී නැති වන අයදුම්පත් පිළිබඳ වග කියනු නොලැබේ.

05. අයදුම්පත් සමග පහත සඳහන් සහතික වල සහතික කරන ලද ඡායාපිටපත් (මුල් පිටපත් නොව) අමුණා එවිය යුතුයි.

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතිකය
3. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්, එක් සහතිකයක් පළාතේ ග්‍රාම නිලධාරී මහතාගෙන් ලබා ගෙන ප්‍රාදේශීය ලේකම්තුමාගේ අනු අත්සන සහිතව ඉදිරිපත් කළ යුතුයි.
4. ඉල්ලුම්කරන වෘත්තීන්ට අදාල පුහුණුවක්/පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතිකය

06. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණයක් සඳහා අදාල කැඳවීම් යථා කාලයේදී කරනු ලැබේ.

07. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරදී මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ බඳවා ගැනීම, අහෝසි කිරීම, වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ජේ. ඒ. අශෝකා කල්‍යාණවතී,
ලේකම්,
හොරණ ප්‍රාදේශීය සභාව.

2010 ජූලි මස 14 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභාව, කනන්විල.

ආදර්ශ අයදුම්පත්‍රය

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ හොරණ ප්‍රාදේශීය සභාව

.................................................................................. තනතුර සඳහා වූ අයදුම්පත්‍රය

01. ඉල්ලුම්කරුගේ නම :————.
02. මුලකුරු සමග නම :————.
03. තැපැල් ලිපිනය:————.
04. උපන් දිනය: වර්ෂය:————. මාසය:————. දිනය:————.
2010.08.25 දිනට වයස :————.අවු. :————.මාස:————. දින.:————.
05. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද ? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද ? යන වග:————.
06. ස්ත්‍රී/පුරුෂ භාවය:————.
07. අධ්‍යාපන සුදුසුකම්:————.
08. වෘත්තීයමය පළපුරුද්ද ඇත්නම්:————.
09. දැනට සේවයේ යෙදී සිටී නම් ඒ පිලිබඳ විස්තර :————.
10. වෙනත් සුදුසුකම් :————.
11. මීට පෙර රජයේ/පළාත් පාලන/පළාත් රාජ්‍ය සේවයේ හෝ සංස්ථාවක ස්ථිර හෝ තාවකාලික හෝ අනියම් සේවයේ යෙදී සිටියේ නම්, එසේ ඉවත් වීමට හෝ කිරීමට හේතු :————.

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බැව් ඔප්පු වුවහොත්, මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා සේවයට බඳවා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත්, කිසිම වන්දියකින් තොරව මා සේවයෙන් පහකිරීමට යටත් වන බව මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

07-909

---

**රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව**

මාර්ග කම්කරු තනතුර

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින ඉහත සඳහන් තනතුරු පිරවීම සඳහා මෙහි සඳහන් සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.

*සේවයේ නිරත කරවීමේ කොන්දේසි :-*

01. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් ක්‍රමය පදනම් කරගනු ලැබේ.
02. වසර තුනක පරිවාස කාලයකට යටත් වේ.
03. ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා මෙම ප්‍රාදේශීය සභාව විසින් වරින් වර පනවනු ලබන නියෝගවලට හා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත් විය යුතුය.

*අවශ්‍ය වෙනත් සුදුසුකම් හා පළපුරුද්ද :-*

01. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.
02. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
03. රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර තුනකට නොඅඩු ස්ථිර පදිංචියක් ඇති අය විය යුතුය.
04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.
05. අදාල තනතුරුවල සේවය කර පළපුරුද්ද තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

*පුරප්පාඩු තනතුරු ගණන* :- 02 (දෙකයි)

*වැටුප් පරිමාණය* - මාසිකව රු.11,730-10x120-10x130- 10x145 -12x160-රු.17,600
(පී. ඒ. චක්‍රලේඛ අංක 06-2006 (iv) පී. ඒ. 01-2006)

*අධ්‍යාපන සුදුසුකම්* - අටවැනි ශ්‍රේණිය/ 9 වසර සමත් විය යුතුයි.

*අයදුම්පත්* .- අයදුම්පත් පහත සඳහන් ආකෘතිය අනුව පිළියෙල කර 2010.08.25 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ''සභාපති, ප්‍රාදේශීය සභාව, රිදීමාලියද්ද'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

එච්. එම්. උපාලි සේනාරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව - රිදීමාලියද්ද.

2010.07.06 දින,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

***රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ ....................................... තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————.
2. තැපැල් ලිපිනය:——————————.
3. උපන් දිනය:
   වර්ෂය :——————————.මාසය:——————————. දිනය:——————————.
4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
   අවුරුදු :——————————.මාස:——————————. දින:——————————.
5. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ඌව පළාත් තුළ පදිංචිව සිටින කාලය :——————————.
6. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ? එසේනම් පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන් ද ? යන වග:——————————.
7. පදිංචි දිස්ත්‍රික්කය:——————————.
8. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
9. විවාහක/අවිවාහක භාවය :——————————.
10. ඔබ කිසියම් සාපරාධී වරදකට උසාවියකින් දඬුවම් ලැබ තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :——————————.
11. අධ්‍යාපන සුදුසුකම් :——————————.
12. ඔබ දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම් එම සේවා කාලය හා විස්තර :——————————.
13. පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් :——————————.

මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එය ඔප්පු වුවහොත් සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවද දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතුය.)

මෙම ඉල්ලුම්කරු වන ................................ මයා/මිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .................................................. වශයෙන් සේවය කරයි. පසුගිය වසර කිහිපය තුළ ඔහු/ඇය වේතනාධික සියල්ල උපයාගෙන ඇත. ඔහු/ඇය විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනයවී නොමැති බවත් පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරන බවද/නොකරන බවද, ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවද සහතික කරමි.

——————————.
දෙපාර්තමේන්තුවේ/ආයතන ප්‍රධානියාගේ හෝ
බලය පවරනු ලබන නිලධාරියාගේ අත්සන.

නම : ——————————.
පදවි නාමය : ——————————.
දිනය : ——————————.
දෙපාර්තමේන්තුව/ආයතනය : ——————————.

07-866

---

# පළාත් පාලන නිවේදන

**මාතර මහ නගර සභාව**

2010/5 පරිපූරක අයවැය ඇස්තමේන්තුව

2010 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද 2010/5 පරිපූරක අයවැය ඇස්තමේන්තුව මාතර මහ නගර සභා කාර්යාලයේ දී 2010.07.26 දින සිට මහජනතාවගේ පරීක්ෂාව සඳහා විවෘතව තබන බව මහ නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 214 (2) (ආ) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. ඩබ්. උපුල් නිශාන්ත,
නගරාධිපති,
මාතර මහ නගර සභාව.

2010 ජූලි මස 06 වැනි දින,
මාතර මහ නගර සභා කාර්යාලයේ දී ය.

07-805

---

**මාවතගම ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24(2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය සභාව විසින් මෙහි අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති මාර්ගය මාවතගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම මාර්ගය සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධතාවයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනයේ සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මාර්ගය මාවතගම ප්‍රාදේශීය සභාව සතු මාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරන බැව් පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත්කරමි.

එච්. එස්. කේ. බී. මීගොල්ල,
සභාපති,
මාවතගම ප්‍රාදේශීය සභාව - මාවතගම.

2010 ජූලි මස 09 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය සභාවේ දී ය.

**උපලේඛනය**

01. මාර්ගයේ නම - මී/මැද්දේගම්ගොඩ පුවක්වල්ලාදෙනිය මාර්ගය
02. මාර්ගයේ දුර - අඩි 1800
03. මාර්ගයේ පළල - අඩි 9-10
04. මාර්ගය ආරම්භවන ස්ථානය - වටරක ඉගුරුවත්ත ප්‍රධාන මාර්ගය
05. මාර්ගය අවසන් වන ස්ථානය - එම්. පී. කේ. නෙවිල් මයාගේ නිවස අසල

*පාරේ වම්පස -*

01. ආර්. ඒ. සිරිමාවතී මිය
02. ආර්. ඒ. අනුර ජයරත්න මයා
03. එම්. ජේ. විමලසේන මයා
04. ආර්. ඒ. ප්‍රේමදාස මයා
05. ආර්. ඒ. ආරියදාස මයා
06. ආර්. ඒ. ලයනල් මයා

*පාරේ වම්පස -*

07. එම්. වයි. අජිත් රණසිංහ මයා
08. එන්. ජී. ජානක විමලරත්න මයා
09. ආර්. ඒ. සිරිසේන මයා
10. එම්. වයි. බන්දු මයා
11. එම්.වයි. සේදරමන් මයා
12. එම්. වයි. ගුණසිරි මයා
13. එම්. වයි. ගුණසේන මයා
14. එම්. වයි. සෝමදාස මයා
15. එම්. වයි. සරඹා මයා
16. එම්. වයි. සිරිසේන මයා
17. එම්. පී. කේ. නෙවිල් මයා

*පාරේ දකුණු පස -*

01. පිටියකන්දවත්ත

07-940

---

**යාපනය මහ නගර සභාව**

1975 අංක 17 දරන සමාජශාලා බලපත්‍ර ලබාදීමේ පනත

පහත නම සඳහන් තැනැත්තා විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජශාලාව එහි සඳහන් ස්ථානයෙහි පවත්වාගෙනයාම සඳහා 2010 වර්ෂයට ලබා ගැනීම පිණිස මා වෙත අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බව 1975 අංක 17 දරන සමාජශාලා බලපත්‍ර දීමේ පනතේ 6 වැනි වගන්තියේ (ඇ) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී සමාජශාලාව අසල හෝ එකී සමාජ ශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය හෝ අදාල හෝ පදිංචි යම් තැනැත්තෙකු, එම සමාජශාලාව සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දින සිට සති හතරක් ඇතුළත තම විරුද්ධත්වයට හේතු ලිඛිතව දක්වමින් පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වමි.

සෙල්ලය්යා සරවණබව,
මහ නගර කොමසාරිස්,
මහ නගර සභාව,
යාපනය.

2010 ජුලි මස 07 වැනි දින,
මහ නගර සභාව,
යාපනය

| *අංකය* | *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *සමාජ ශාලාවේ සභාපති ද, ලේකම් ද, කළමනාකරු ද, යන වග* | *සමාජශාලාවේ නම* | *සමාජශාලාවේ කටයුතු කරගෙන යෑමට බලාපොරොත්තු වන ස්ථානය* |
|---|---|---|---|---|
| 01. | ඒ. ඒ. ජාන්ස්ටින්, අංක 68, රාසාවින් තෝට්ටම් වීදිය, යාපනය | ලේකම් | සෙවන් ලෙවන් ක්‍රීඩා සමාජය | අංක 66, රාසාවින් තෝට්ටම් වීදිය, යාපනය. |

07-803

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.